පළාත්අධ්‍යාපනදෙපාර්තමේන්තුවසබරගමුව - සතිපාසල

විෂය - විද්‍යාව

ජනවාරි සිව්වන සතිය

9 ශ්‍රේණිය

සැකසුම - ටී.සී.එච්. පියදාස
ර/නිවි/දිමියාව මහා විද්‍යාලය

**මාතෘකාව** - ක්ෂුද්‍ර ජීවීන්ගේ අහිතකර බලපෑම්

**පාඩම -** ක්ෂුද්‍ර ජීවීන්ගේ භාවිත - ක්ෂුද්‍ර ජීවීන්ගේ බලපෑම්

**ඉගෙනීම් කාලය** - පැය 3.30

**ඉගෙනුම් ඵල -** ● රෝග ඇතිවීම, ආහාර නරක් වීම, ජෛව රසායනික අවි ලෙස ක්ෂුද්‍ර ජීවීන් යොදා ගැනීම අහිතකර බලපෑම් ලෙස ප්‍රකාශ කරයි.

**ක්‍රියාකාරකම් සඳහා උපදෙස් -**

- පළමුව ඔබ පෙල පොතෙහි (1 කොටස) පිටු අංක 10 සිට 13 දක්වා පිටු හොඳින් අධ්‍යයනය කරන්න. කීප වතාවක් නැවත නැවත අධ්‍යයනය කරන්න.
- රෝග ඇති කිරීමට දායක වන ක්ෂුද්‍ර ජීවී කාණ්ඩ නම් කරන්න.
- පහත සඳහන් පද හඳුන්වන්න.
    - ව්‍යාධිජනකයා
    - වාහකයා
    - ධාරකයා
- පෙල පොතේ පිටු අංක 11 හි සඳහන් වගුව 1.2 අධ්‍යයනය කරමින් ක්ෂුද්‍ර ජීවීන් මගින් මිනිසාට ඇති කරන රෝග හා සම්බන්ධ තොරතුරු පිළිබඳ අධ්‍යයනය කරන්න.
- ක්ෂුද්‍ර ජීවීන් මගින් ශාකවලට වැළඳෙන රෝග නම් කරන්න.
- ක්ෂුද්‍ර ජීවීන් මගින් ආහාර නරක් වීම පිළිබඳ විස්තර කරන්න. (ආහාර නරක්වීමේ ක්‍රම පිළිබඳව 8 වන ශ්‍රේණියේ පෙල පොත අධ්‍යයනය කරන්න)
- ජෛව රසායනික අවි ලෙස ක්ෂුද්‍ර ජීවීන් යොදා ගැනීම පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.
- අභ්‍යාසය සම්පූර්ණ කරන්න. ( පිටු අංක 14 සිට 15 )

**අමතර ක්‍රියාකාරකමක් ලෙස -**

- හැකිනම් https:/biologylab.org/topicmicrobial-diseases/ වෙබ් අඩවියට පිවිස වැඩිදුර තොරතුරු කියවන්න.
- ක්ෂුද්‍ර ජීවීන්ගේ අහිතකර බලපෑම් පිළිබඳ බිත්ති පුවත්පත සඳහා නිර්මාණයක් සකස් කරන්න.